# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2227/5 - 2021 මැයි මස 10 වැනි සඳුදා - 2021.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

**ජනාධිපති විධානය**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථිකයක් බවට ශ්‍රී ලංකාව පත්කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා
   ජනාධිපති විශේෂ නියෝජිත
2. ගරු ආර්. එම්. සී. බී. රත්නායක මැතිතුමා, පා.ම.
   වනජීවී හා වන සංරක්ෂන අමාත්‍ය
3. ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, පා.ම.
   වාරිමාර්ග අමාත්‍ය
4. ගරු මහින්ද අමරවීර මැතිතුමා, පා.ම.
   පරිසර අමාත්‍ය
5. ගරු මහින්දානන්ද අළුත්ගමගේ මැතිතුමා, පා.ම.
   කෘෂිකර්ම අමාත්‍ය
6. ගරු රමේෂ් පතිරණ මැතිතුමා, පා.ම.
   වැවිලි අමාත්‍ය
7. ගරු දුමින්ද දිසානායක මැතිතුමා, පා.ම.
   සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

1A - G 34170 — 395 (2021/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

8. ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා, පා.ම.
පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය
9. ගරු රොෂාන් රණසිංහ මැතිතුමා, පා.ම.
පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය
10. ගරු කනක හේරත් මැතිතුමා, පා.ම.
සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
11. ගරු ජානක වක්කුඹුර මැතිතුමා, පා.ම.
උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
12. ගරු මොහාන් ද සිල්වා මැතිතුමා, පා.ම.
කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍ය
13. ගරු විමලවීර දිසානායක මැතිතුමා, පා.ම.
වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
14. ගරු කංචන විජේසේකර මැතිතුමා, පා.ම.
විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය
15. ගරු සදාසිවම් වියාලේන්ද්‍රන් මැතිතුමා, පා.ම.
පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
16. ගරු ඩී. බී. හේරත් මැතිතුමා, පා.ම.
පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය
17. ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා, පා.ම.
වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය
18. ගරු නාලක ගොඩහේවා මැතිතුමා, පා.ම.
නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය
19. ගරු සීතා අරඹේපොල මැතිතුමිය, පා.ම.
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය
20. ගරු චන්න ජයසුමන මැතිතුමා, පා.ම.
ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය
21. ගරු අනුරාධා යහම්පත් මැතිතුමිය
ආණ්ඩුකාරවර, නැගෙනහිර පළාත
22. ගරු මංජුලා දිසානායක මැතිතුමිය, පා.ම.
23. ආචාර්ය එම්. ඩබ්ලිව්. එන්. ධර්මවර්ධන මැතිතුමා
සභාපති, තේ පර්යේෂණ ආයතනය
24. ජයම්පති මොල්ලිගොඩ මැතිතුමා
සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය
25. ජයන්ත වික්‍රමසිංහ මැතිතුමා
සභාපති, පොල් පර්යේෂණ ආයතනය
26. මහාචාර්ය සුදීරා රන්වල මැතිතුමිය
සභාපති, රබර් පර්යේෂණ ආයතනය
27. ආචාර්ය ජී. ඒ. එස්. ප්‍රේමකුමාර මැතිතුමා
සභාපති, කාර්මික තාක්ෂණ ආයතනය
28. වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මැතිතුමා
විශේෂඥ වෛද්‍ය
29. ආචාර්ය ඩී. එම්. ජේ. බී. සේනානායක
අධ්‍යක්ෂ, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
30. මහාචාර්ය එස්. ආනන්ද කුලසූරිය මැතිතුමා
ජාතික මූලික අධ්‍යයන ආයතනය
31. ආචාර්ය ටී. එල්. ගුණරුවන් මැතිතුමා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

32. මහාචාර්ය පී. අයි. යාපා මැතිතුමා
සබරගමුව විශ්වවිද්‍යාලය
33. ආචාර්ය එච්. එම්. ජී. එස්. බී. හිටිනායක මැතිතුමා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
34. ආචාර්ය අසීස් මුබාරක් මැතිතුමා
පර්යේෂණ හා නව නිපැයුම් ප්‍රධානී, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්
35. ආචාර්ය යසන්තා මාපටුන මැතිතුමිය
කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන
36. ආචාර්ය ක්‍රිස් ධර්මකීර්ති මැතිතුමා
පාරිසරික විද්‍යාඥ
37. සචිත්‍ර යාපා මැතිතුමා
සාමාන්‍යාධිකාරී, මාර්ජිනලයිස්ඩ් ඕර්ගනික් ප්‍රඩියුසර්ස් ඇසෝසියේෂන්
38. විකී වික්‍රමතුංග මැතිතුමා
කළමනාකරණ අධ්‍යක්ෂ, ඇග්‍රිවර්ල්ඩ් (පුද්.) සමාගම
39. හර්මන් ගුණරත්න මැතිතුමා
ඉඩම් හිමි වැවිලිකරු හා හිමිකරු, හර්මන් ටී
40. ධම්මික කොබ්බෑකඩුව මැතිතුමා
සාමාන්‍යාධිකාරී (මානව සම්පත්), ලලාන් රබර් ඇග්‍රි ඩිවිෂන්
41. දේවක වික්‍රමසූරිය මැතිතුමා
හිටපු සභාපති, ඇල්කඩුව වැවිලි සමාගම
42. ජීවක අතපත්තු මැතිතුමා
සභාපති, ස්ටැන්ඩර්ඩ් ටී ඇන්ඩ් ලැන්ඩ් ලිමිටඩ්
43. දිල්ශාන් ප්‍රනාන්දු මැතිතුමා
ප්‍රධාන විධායක නිලධාරී, ඩිල්මා සිලෝන් ටී කම්පනි පීඑල්සී
44. මොහොමඩ් අනීස් ජුනයිඩ් මැතිතුමා
45. දිලිත් ජයවීර මැතිතුමා
සභාපති, දෙරණ මාධ්‍ය ජාලය
46. විජිත් වැලිකල මැතිතුමා
සභාපති, වයිල්ඩ් හොලිඩේස් (පුද්ගලික) සමාගම

වෙත,

ශුභා ශිංසන පූර්වකවය!

දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථික රටාවක් කරා ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් 2021.04.27 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ අන්තර්ගත සමස්ථ ප්‍රතිපත්ති රාමුව හා යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති හෙයින් ද,

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අවධාරණයට ලක් කර ඇති පොහොර භාවිතය, භූමිය, ජෛව විවිධත්වය, වායුගෝලය, අපද්‍රව්‍ය, කර්මාන්ත, පුනර්ජනනීය බලශක්තිය, ජනාවාස හා නගර සහ පාරිසරික අධ්‍යාපනය පිළිබඳ කරුණු සැලකිල්ලට ගනිමින් එම අභියෝගවලට මුහුණ දීමට පැහැදිලි ජනතා වරමක් ලබා දී ඇති හෙයින් ද,

වර්තමානය වන විට රසායනික පොහොර, වල්නාශක හා පළිබෝධ නාශක සඳහා අති විශාල ජාතික වියදමක් දැරීමට අමතරව, එමගින් පස හා ජලය දූෂණය වීම තුළ සාපේක්ෂව ගුණාත්මක නිෂ්පාදන නොලැබීම හා ඒවායේ අධි භාවිතය හේතුවෙන් ගංගා, වැව් අමුණු ජලය දූෂණය වීම හා ජනතාවට ඇතිවන රෝගාබාධ නිසා ඔවුන් ගේ සෞඛ්‍ය තත්ත්වය හා ජීවනෝපාය මාර්ග අහිමි වීම මෙන්ම වසවිසෙන් තොර ආහාර ලබා ගැනීමේ දුෂ්කරතා වැඩිවීම වැනි කරුණු සැලකිල්ලට ගනිමින් ද,

රසායනික පොහොර, ඉන්ධන, ප්ලාස්ටික්, රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා රටින් පිටට ගලා යන විදේශ විනිමය රට තුළ ඉතිරි කරගැනීමටත්, කාබනික හා ස්වභාවික පොහොර යෙදීමෙන් ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හා පරිසර හිතකාමී සෞඛ්‍ය සම්පන්න, ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩපිළිවෙලක් තුළින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් අත්කරගත හැකි ප්‍රතිලාභ පිළිබඳවත්, දේශගුණික විපර්යාස අවම කරගැනීම තුළින් හා හරිත ආර්ථිකයක් මගින් තිරසර සංවර්ධනයක් අත්පත් කර ගැනීමට ඇති හැකියාව පුළුල්වී ඇති බැවින් ද,

නැගී එන ගෝලීය ආර්ථික රටාව තුළ ගෝලීය ආර්ථිකයේ ඉහළ වාසිදායක තත්ත්වයන් රටට හිමිකර ගැනීමට පරිසර හිතකාමී සමාජ ආර්ථික රටාවකට ජනතාව පෙළගැස්වීමට ශ්‍රී ලංකාව තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථික රටාවකට ප්‍රවේශ වීමේ ප්‍රමුඛත්වයට පැමිණීම තුළ ක්‍රියාත්මක විය යුතු හෙයින් ද,

1. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා
   ජනාධිපති විශේෂ නියෝජිත
2. ගරු ආර්. එම්. සී. බී. රත්නායක මැතිතුමා, පා.ම.
   වනජීවී හා වන සංරක්ෂන අමාත්‍ය
3. ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, පා.ම.
   වාරිමාර්ග අමාත්‍ය
4. ගරු මහින්ද අමරවීර මැතිතුමා, පා.ම.
   පරිසර අමාත්‍ය
5. ගරු මහින්දානන්ද අළුත්ගමගේ මැතිතුමා, පා.ම.
   කෘෂිකර්ම අමාත්‍ය
6. ගරු රමේෂ් පතිරණ මැතිතුමා, පා.ම.
   වැවිලි අමාත්‍ය
7. ගරු දුමින්ද දිසානායක මැතිතුමා, පා.ම.
   සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
8. ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා, පා.ම.
   පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය
9. ගරු රොෂාන් රණසිංහ මැතිතුමා, පා.ම.
   පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය
10. ගරු කනක හේරත් මැතිතුමා, පා.ම.
    සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
11. ගරු ජානක වක්කුඹුර මැතිතුමා, පා.ම.
    උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
12. ගරු මොහාන් ද සිල්වා මැතිතුමා, පා.ම.
    කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍ය
13. ගරු විමලවීර දිසානායක මැතිතුමා, පා.ම.
    වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
14. ගරු කංචන විජේසේකර මැතිතුමා, පා.ම.
    විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය
15. ගරු සදාසිවම් වියාලේන්ද්‍රන් මැතිතුමා, පා.ම.
    පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය
16. ගරු ඩී. බී. හේරත් මැතිතුමා, පා.ම.
    පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය
17. ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා, පා.ම.
    වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය
18. ගරු නාලක ගොඩහේවා මැතිතුමා, පා.ම.
    නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය
19. ගරු සීතා අරඹෙපොල මැතිතුමිය, පා.ම.
    නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය
20. ගරු චන්න ජයසුමන මැතිතුමා, පා.ම.
    ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය
21. ගරු අනුරාධා යහම්පත් මැතිතුමිය
    ආණ්ඩුකාරවර, නැගෙනහිර පළාත
22. ගරු මංජුලා දිසානායක මැතිතුමිය, පා.ම.
23. ආචාර්ය එම්. ඩබ්ලිව්. එන්. ධර්මවර්ධන මැතිතුමා
    සභාපති, තේ පර්යේෂණ ආයතනය

24. ජයම්පති මොල්ලිගොඩ මැතිතුමා
    සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය
25. ජයන්ත වික්‍රමසිංහ මැතිතුමා
    සභාපති, පොල් පර්යේෂණ ආයතනය
26. මහාචාර්ය සුදීරා රන්වල මැතිතුමිය
    සභාපති, රබර් පර්යේෂණ ආයතනය
27. ආචාර්ය ජී. ඒ. එස්. ප්‍රේමකුමාර මැතිතුමා
    සභාපති, කාර්මික තාක්ෂණ ආයතනය
28. වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මැතිතුමා
    විශේෂඥ වෛද්‍ය
29. ආචාර්ය ඩී.එම්.ජේ.බී. සේනානායක
    අධ්‍යක්ෂ, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
30. මහාචාර්ය එස්. ආනන්ද කුලසූරිය මැතිතුමා
    ජාතික මූලික අධ්‍යයන ආයතනය
31. ආචාර්ය ටී. එල්. ගුණරුවන් මැතිතුමා
    ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
32. මහාචාර්ය පී.අයි. යාපා මැතිතුමා
    සබරගමුව විශ්වවිද්‍යාලය
33. ආචාර්ය එච්. එම්. ජී. එස්. බී. හිටිනායක මැතිතුමා
    ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
34. ආචාර්ය අසීස් මුබාරක් මැතිතුමා
    පර්යේෂණ හා නව නිපැයුම් ප්‍රධානී, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්
35. ආචාර්ය යසන්තා මාපටුන මැතිතුමිය
    කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන
36. ආචාර්ය ක්‍රිස් ධර්මකීර්ති මැතිතුමා
    පාරිසරික විද්‍යාඥ
37. සචිත්‍ර යාපා මැතිතුමා
    සාමාන්‍යාධිකාරී, මාර්ජිනලයිස්ඩ් ඕර්ගනික් ප්‍රඩියුසර්ස් ඇසෝසියේෂන්
38. විකී වික්‍රමතුංග මැතිතුමා
    කළමනාකරණ අධ්‍යක්ෂ, ඇග්‍රිවර්ල්ඩ් (පුද්.) සමාගම
39. හර්මන් ගුණරත්න මැතිතුමා
    ඉඩම් හිමි වැවිලිකරු හා හිමිකරු, හර්මන් ටී
40. ධම්මික කොබ්බෑකඩුව මැතිතුමා
    සාමාන්‍යාධිකාරී (මානව සම්පත්), ලලාන් රබර් ඇග්‍රි ඩිවිෂන්
41. දේවක වික්‍රමසූරිය මැතිතුමා
    හිටපු සභාපති, ඇල්කඩුව වැවිලි සමාගම
42. ජීවක අතපත්තු මැතිතුමා
    සභාපති, ස්ටෑන්ඩර්ඩ් ටී ඇන්ඩ් ලෑන්ඩ් ලිමිටඩ්
43. දිල්ශාන් ප්‍රනාන්දු මැතිතුමා
    ප්‍රධාන විධායක නිලධාරී, ඩිල්මා සිලෝන් ටී කම්පනි පීඑල්සී
44. මොහොමඩ් අනීස් ජුනයිඩ් මැතිතුමා
45. දිලිත් ජයවීර මැතිතුමා
    සභාපති, දෙරණ මාධ්‍ය ජාලය
46. විජිත් වැලිකල මැතිතුමා
    සභාපති, වයිල්ඩ් හොලිඩේස් (පුද්ගලික) සමාගම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්දර ගෝඨාභය රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍ය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ඔබතුමන්ලා දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථිකයක් බවට ශ්‍රී ලංකාව පත්කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකායේ සාමාජිකයින් වශයෙන් මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

මෙම කාර්යසාධක බලකාය "දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත ශ්‍රී ලංකාවක් ඇතිකිරීමේ ජනාධිපති කාර්යසාධක බලකාය" ලෙස නම් කෙරේ.

1. කෘෂිකර්මාන්තය සඳහා රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක වෙනුවට කාබනික පොහොර හා නිෂ්පාදන භාවිතා කරමින් පූර්ණ වශයෙන් රසායනික ගොවිතැනින් ස්වභාවික ගොවිතැනට පරිවර්තනය වීම සඳහා මාර්ග සිතියමක් (Road Map) පිළියෙල කර සමස්ත වශයෙන් පසුගිය වර්ෂය පාදක කරගෙන කොටස් වශයෙන් නොවන කඩිනම් වැඩපිළිවෙලක් (front loaded actions programme) ලෙස රසායනික පොහොර භාවිතයෙන් ඉවත් වීම හා ප්‍රශස්ත පොහොර සම්මිශ්‍රණයන් යොදා පස, ජලය හා භෝග පෝෂණය මගින් ඵලදාව ඉහළ නැංවීමට ආහාර භෝග වගා කරනු ලබන ගොවිපළ සඳහා කාබනික හා ස්වභාවික පොහොර සැපයීමට ප්‍රාදේශීය වශයෙන් ගවයින්, එළුවන් සහ කුකුළන් වැනි සත්ත්ව අපද්‍රව්‍ය හා නේවාසික අපද්‍රව්‍ය යොදා එවැනි පොහොර නිෂ්පාදන හා සැපයුම්කරුවන් දිරිගැන්වීමට මෙන්ම, සංවිධානාත්මක ව්‍යාපාර ක්ෂේත්‍රය යොමු කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම,

2. කුඩා, මධ්‍යම පරිමාණ හා සංවිධානාත්මක ව්‍යාපාර ක්ෂේත්‍රය ඉහළ ප්‍රමිතියෙන් හා ගුණාත්මක බවින් යුතු කාබනික පොහොර සම්පාදනයට හා එවැනි උසස් ප්‍රමිතියෙන් සම්පාදනය කරන රටවල් හඳුනාගෙන ඒවා ආනයනය කිරීමෙන් ජාතික පොහොර අවශ්‍යතාව සපුරා ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම,

3. කාබනික පොහොර යොදා වගා කටයුතු කිරීමේ තාක්ෂණික දැනුම ගොවීන් අතර ප්‍රචලිත කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කුඩා තේ වතු සංවර්ධන මණ්ඩලය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගාකිරීමේ මණ්ඩලය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියලුම සංවර්ධන නිලධාරීන්, ව්‍යාප්ත සේවා නිලධාරීන් හා පර්යේෂණ නිලධාරීන් යොදා ව්‍යාප්ත හා ආවරණ අධීක්ෂණ සේවා පවත්වා ගැනීමට හා විශ්වවිද්‍යාලවල කෘෂිකර්ම පීඨවල ආචාර්යවරුන් හා කෘෂිවිද්‍යාඥයින්, වෘත්තිකයින්, ඉඩම් හිමි වැවිලිකරුවන් ඇතුළු සියලුපාර්ශව ඇතුළත් ජනතා කේන්ද්‍රීය (inclusive people centric) වැඩපිළිවෙලක් සඳහා ක්‍රියාමාර්ග ගැනීම,

4. දැනට වගා නොකර ඇති පුරන් කුඹුරුවල ප්‍රයෝජනයට ගතහැකි කුඹුරු සංවර්ධනය කරමින් කාබනික හා ස්වාභාවික පොහොර යොදාගනිමින් එළවළු, පළතුරු, පාරම්පරික වී, මල්, පලා වර්ග ආදිය වගා කිරීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා අදාළ ප්‍රදේශවල ගොවීන් යොදා ගැනීම,

5. වැවිලි සමාගම්වලට අයත් වගාකර නොමැති ඉඩම්වල තේ, පොල්, රබර් මෙන්ම කුරුඳු ගම්මිරිස්, කොස් වැනි වගාවන් සඳහා, එම වගාවන් සඳහා උනන්දුව දක්වන තරුණ ව්‍යවසායකයන් යොදාගනිමින් වගාකර නොමැති ඉඩම් කඩිනමින් වගා කිරීමට කටයුතු කිරීම,

6. කාබනික පොහොර බෙදා හැරීම සඳහා රාජ්‍ය පොහොර හා පෞද්ගලික පොහොර සමාගම්වල රටපුරා විසිර ඇති වෙළඳ ජාලය යොමු කිරීම,

7. වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය, ආහාර සැපයුම වැඩි කිරීම සහ ප්‍රාදේශීය වශයෙන් එම වගාවන් කරන ප්‍රදේශ හා ගොවීන් හඳුනාගැනීම, එම ඵලදාවන් වැඩිකිරීම හා එම ආහාර දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත කර බෙදා හැරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම,

8. පරිසර සහ වායු දූෂණය (environment & air pollution) අවම කිරීම සඳහා ෆොසිල ඉන්ධන (fossil fuel) වෙනුවට සූර්ය බලශක්ති හා සුළං විදුලි බලාගාර වැනි පුනර්ජනනීය බලශක්ති (renewable energy) ව්‍යාපෘති හා විදුලි මෝටර් රථ (electric vehicles) භාවිතය බාධාවකින් තොරව කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගෙන තීරණ ක්‍රියාත්මක කිරීම,

9. තහනම් කර ඇති ප්ලාස්ටික් (plastic) භාවිතය තවදුරටත් අවම කිරීමට සහ රසායනික ආනයනයන් සීමා කිරීම සඳහා සුදුසු යෝජනා සහ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම,

10. පාංශු සංරක්ෂණය හා ජල පෝෂිත සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය වන පරිදි දැනට තහනම් කර ඇති කටුපොල් වගාව තවදුරටත් සිදුවීම වළක්වා ගැනීමට හා වගා කර ඇති කටුපොල් වැනි අහිතකර වගාවන් ඉවත් කිරීමට මා විසින් 2021 අප්‍රේල් මස 05 වැනි දින අංක : 2222/13 දරන ගැසට් පත්‍රයෙන් නිකුත් කළ විධායක නියෝගය ක්‍රියාත්මක කිරීම වහාම ආරම්භ කිරීම,

11. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් නිරීක්ෂණය කර ඇති රක්ෂිත වනාන්තරවල දැනට හඳුනාගෙන ඇති හානි කර ඇති කැලෑ ඉතා කඩිනමින් වගා කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම,

12. අලි මිනිස් ගැටුම් අවසන් කිරීම සඳහා අලිමංකඩවල් අවහිර වන සේ පදිංචිව සිටින පදිංචිකරුවන් සුදුසු ස්ථානවල නැවත පදිංචි කර, වන අලි මාර්ග (elephant corridors) නිසි ලෙස සකස් කිරීමට හා අලි වැට ඉදිකිරීම් කඩිනම් කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඉදිරිපත් කිරීම,

13. නාගරික නිවාස හා ගොඩනැගිලි පරිසර හිතකාමී ලෙස ඉදිකිරීම සඳහා අදාළ අංශ සහ පුද්ගලයින් දිරි ගැන්වීමට සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම,

14. හරිත පරිසරයක් ආරක්ෂා කිරීම සඳහා කැළි කසළ නිසි ලෙස බැහැර කිරීමට සහ ප්‍රතිචක්‍රීයකරණය මගින් ඉවතලන අපද්‍රව්‍ය කාබනික අමුද්‍රව්‍යයන් බවට පත්කිරීමේ ක්‍රමවේදයක් සඳහා සියලුම කර්මාන්ත දිරිගැන්වීමට අවශ්‍ය පියවර ගැනීම,

15. ජෛව විවිධත්වය හා පරිසරය ආරක්ෂා කිරීම සහ තිරසර සංවර්ධනය මුල් කරගත් විෂයය මූලික හා බාහිර ක්‍රියාකාරකම් මගින් දරුවන් තුළ පරිසරය කෙරෙහි දැනුම සහ ආකල්ප වර්ධනය කිරීම සඳහා පාසැල් හා උසස් අධ්‍යාපන පද්ධතිය වැඩි දියුණු කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම,

16. පරිසර සංරක්ෂණය තුළින් දේශගුණික විපර්යාසයන්ට තිරසර විසඳුම් ලබා ගැනීම සඳහා ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති කරමින්, හරිත ආර්ථිකයක් (green economy) කරා පියනැගීම සඳහා විද්වත් සංවාද, රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන්, ප්‍රජා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජනමාධ්‍ය යොදා ගැනීම සම්බන්ධීකරණය කිරීම,

17. ජාතික පොහොර ලේකම් කාර්යාලය ජාතික කාබනික හා ස්වාභාවික පොහොර ලේකම් කාර්යාලය ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට නිකුත් කර ඇති උපදෙස් ක්‍රියාත්මක කිරීම හා ස්වාභාවික හා කාබනික පොහොර ව්‍යාපාරිකයින් හා එයට අදාළ විෂය දැනුම ඇති රාජ්‍ය නිලධාරීන් යොදා නව ආයතනික නායකත්වයක් ඇති කිරීම,

18. ලංකා පොහොර සමාගම හා කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කර කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදනය හා බෙදා හැරීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ආනයනය නතර කිරීමට පියවර ගැනීම,

19. රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික හා ස්වභාවික පොහොර යොදාගැනීමේ ක්‍රමවේදයන් හා අන්තර්කාලීන ගැටළු නිරාකරණය කිරීම සඳහා චක්‍රලේඛන හා උපදෙස් නිකුත් කිරීම,

20. දැනට රට තුළ ඇති රසායනික පොහොර තොග සියල්ල ආනයනය කරුවන්ගෙන් හා දේශීය තොග බෙදාහරින්න්ගෙන් ලබාගෙන එම පොහොර සඳහා උපරිම මිළ තීරණය කර එය යෙදිය යුතු ප්‍රමාණය හඳුනා ගැනීමට අවශ්‍ය රෙගුලාසි ගැසට් කර එම නියෝග උල්ලංඝණය කරන්නන්ගේ ව්‍යාපාර තහනම් කිරීම,

21. කෙටිකාලීනව අවශ්‍ය සංක්‍රාන්තික රසායනික පොහොර අවශ්‍යතාව විද්‍යාත්මකව ගණනය කර එය යොදාගත යුතු ප්‍රමාණයන්, භෝගයන් සහ බෙදාහැරීමේ ක්‍රමවේදය හඳුනාගෙන පරිපාලනමය ගැටළු කළමනාකරණය කිරීම,

22. දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ගොවිජන සංවර්ධනය දෙපාර්තමේන්තුව හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින්, ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමෙන් හරිත නිෂ්පාදන හා හරිත සමාජයක් ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම,

23. 2021.04.27 දින අමාත්‍ය මණ්ඩලය අනුමත කළ ප්‍රතිපත්ති හා තීරණ රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ මනා ලෙස සම්බන්ධීකරණය කිරීම හා සංක්‍රාන්තිකව මුහුණ දෙන ගැටළු වහා විසඳීම,

24. දේශගුණික විපර්යාස හා හරිත සමාජ හා ආර්ථික වැඩසටහන් දිරිගන්වන ජාත්‍යන්තර මූල්‍ය හා තාක්ෂණ ආයතන, එක්සත් ජාතීන්ගේ ආයතන, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, පරිසර සංවර්ධන අරමුදල් හා මූල්‍ය ආයතන හා ඔවුන් ගේ දේශීය කාර්යාල හා තානාපති සේවාවන් මෙන්ම, ශ්‍රී ලංකාවේ විදේශ තානාපති සේවාවන් ශ්‍රී ලංකාව ගෙන ඇති පුරෝගාමී පියවරට දායක කර ගැනීම,

25. ජාත්‍යන්තර මූල්‍ය ආයතන හා වෙළඳපළ වෙතින් නව මූල්‍යකරණ ක්‍රියාවන් මතු කරමින් හරිත බැඳුම්කර මූල්‍ය උපකරණයන් (green bonds and financial instruments) දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ කඩිනම් අවධානය යොමු කිරීම,

තවද, ජනාධිපති විශේෂ නියෝජිත, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, පූර්වෝක්ත කාර්ය සාධක බලකායේ සභාපති ලෙස පත් කරමි.

තවද, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධක බලකාය සහ ගම සමග පිළිසඳර ග්‍රාමීය සංවර්ධන ජනාධිපති කාර්ය සාධක බලකාය සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කළ යුතු බව උක්ත කාර්යසාධක බලකායට මම මෙයින් නියම කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තවයයන් ඉටු කරලීමට අදාළව අවශ්‍ය පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට උක්ත ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තවද, පෙරකී බලකායේ සාමාජිකයින් වන ඔබ අවම වශයෙන් මසකට වරක් මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් නියම කරමි.

තවද, මෙම ජනාධිපති කාර්ය සාධක බලකාය වෙතින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත් කාර්ය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතු යැයිද, ලබාදිය යුතු සියළුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියළුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියළුම නිලධරයන්ට හා සෙසු තැනැත්තන්ට නියම කොට විධාන කරමි.

තවද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙර කී කාර්ය සාධක බලකාය විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියළු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ මැයි මස 10 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.